# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2052/32 - 2018 ජනවාරි මස 05 වැනි සිකුරාදා - 2018.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (1) ව්‍යවස්ථාව අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මැතිවරණ කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු බැවින් ද 2012 අංක 22 දරන පනතින් සංශෝධිත 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76 අ වගන්තිය අනුව ඡන්ද විමසීම පැවැත්වීමට ඇති බාධා ඉවත් කර ගැනීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව විසින් විධාන පැනවීමට හැකි හෙයින්ද මැතිවරණ කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන විධාන, නියම කොට පනවනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**01. ඡන්ද විමසීම් දිනයට පෙර පැය 48 පෙර සිට ප්‍රචාරක කටයුතු අත්හිටුවීම**

ඡන්ද විමසීමේ දිනයට පැය 48 කට පෙර සිට ඡන්ද විමසීමේ ප්‍රතිඵලයට බලපෑ හැකි කිසිදු ආකාරයක පක්ෂ හෝ කණ්ඩායම් හෝ අපේක්ෂකයින් හෝ ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවක් නැතහොත් පක්ෂ හෝ කණ්ඩායම් හෝ අපේක්ෂකයින් අගතියට පත් කිරීමේ ක්‍රියාවක් සිදු කිරීම තහනම් කරන බව මෙයින් නියම කරනු ලැබේ.

(අ) කුමන ආකාරයක හෝ ප්‍රචාරක රැස්වීම් පැවැත්වීම.

(ආ) ඡන්ද ආයාචනා කිරීම සඳහා ගෘහයෙන් ගෘහයට යෑම.

(ඇ) අත්පත්‍රිකා හෝ දැන්වීම් කොළ බෙදා හැරීම.

(ඈ) අපේක්ෂකයන්ගේ ගමන් ගන්නා වාහනයේ හැර අන් කිසිදු වාහනයක, වාසස්ථානයක, වාසස්ථානයක් නොවන ගොඩනැගිල්ලක, තාවකාලික ඉදිකිරීමක, හිස් බිමක, පොදු ස්ථානයක හෝ මහජනයාට පෙනෙන ඕනෑම ස්ථානයක පක්ෂ, කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනයට හෝ අගතියට පත් කළ හැකි ධජ, පතාක, සැරසිලි, දැන්වීම්, චිත්‍ර, ඡායාරූප ප්‍රදර්ශනය කිරීම හෝ සවිකිරීම.

(ඉ) මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් නැතහොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය හා සමාජ ජාල මාධ්‍ය හෝ දුරකථන හරහා ඡන්ද ආයාචනා කිරීම හා ඉහත මාධ්‍ය හරහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.

(ඊ) ශබ්ද විකාශන යන්ත්‍ර හරහා ප්‍රචාරක කටයුතු සිදු කිරීම.

(උ) ආගමික වතාවත් සිදු කිරීමේ ව්‍යාජයෙන් ප්‍රචාරක කටයුතු සිදු කිරීම.

(ඌ) මෙම කාලසීමාව තුළ කාර්යාලයක් ලෙස පවත්වාගෙන යන අපේක්ෂකයාගේ නිවසෙහි වුවද පක්ෂ/කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන දැන්වීම්, කටවුට්, ඡායාරූප, චිත්‍ර, ධජ, පතාක, සැරසිලි කිසිවක් ප්‍රදර්ශනය නොකළ යුතු ය.

**02. ඡන්ද ආයාචනය කිරීම සඳහා ගෘහයෙන් ගෘහයට යෑම සහ අත් පත්‍රිකා බෙදා හැරීම.**

නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනයෙන් ආරම්භව ඡන්ද විමසීම පවත්වන දිනයට පැය 48 කට පෙර අවසන් වන කාලසීමාව ඇතුළත යම් අපේක්ෂකයෙකුට ඡන්ද ආයාචනය සඳහා

(අ) ඡන්ද විමසීම් කාලසීමාව තුළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට හා ගෘහයෙන් ගෘහයට යෑම සඳහා කොන්දේසි සහිත අනුමැතියක් ලබා දෙනු ලැබේ.

හේතුවන පෙරහැර හා පෙළපාලි පැවැත්වීම තහනම් බැවින් මේ සඳහා සහභාගි විය හැක්කේ අපේක්ෂකයාට සහ උපරිම වශයෙන් තවත් 10 දෙනෙකුට පමණි. එනම් එම කාර්යය පෙරහැරක්, පෙළපාලියක් නොවිය යුතු ය.

(ආ) ශබ්ද උපදවන හෝ විස්තාරණය කරන කිසිදු උපකරණයක් හෝ සංගීත කණ්ඩායම් භාවිතා කිරීම සහ ඝෝෂා කරමින් ගෘහයෙන් ගෘහයට ගමන් කිරීම හෝ තහනම් වේ. තවද මෙම අවස්ථාවලදී දැන්වීම් ප්‍රචාරක පුවරු, ධජ, පතාක ප්‍රදර්ශනය කිරීම හෝ රැගෙන යාම නොකළ යුතු ය.

(ඇ) පක්ෂයේ හෝ අපේක්ෂකයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශන අත්පත්‍රිකාවක් ලෙස ඡන්ද හිමියන්ට ලබා දීමට අවස්ථාව ඇති අතර එම ප්‍රතිපත්ති ප්‍රකාශයේ අපේක්ෂකයාගේ රුව (අවශ්‍ය නම් සෙසු අපේක්ෂකයින්ගේ රුව), පක්ෂයේ/කණ්ඩායමේ නම හා සලකුණ පමණක් ඇතුළත් කළ හැකිය. මෙම අත් පත්‍රිකා, ප්‍රදර්ශනය කළ හැකි ප්‍රචාරක දැන්වීම් ලෙස සකස් නොකළ යුතු ය. ප්‍රචාරක දැන්වීම් ලෙස භාවිතා නොකළ යුතු ය.

(ඈ) ප්‍රසිද්ධ ස්ථානවල, කිසිදු ශබ්දය උපදවන හෝ විස්තාරණය කරන උපකරණ භාවිතයකින් තොරව සාමකාමීව මහජනතාවට බාධාවක් නොවන සේ අත්පත්‍රිකා බෙදා හැරීමට හැකියාව ඇත්තේ ය.

(ඉ) බෙදා හරිනු ලබන අත්පත්‍රිකාවල මුද්‍රණකරුගේ හා ප්‍රකාශකගේ නම් සහ අදාළ තොරතුරු ඇතුළත් විය යුතු අතර එම අත්පත්‍රිකා, කිසිම ආකාරයක වෛරී ප්‍රකාශ හෝ ආගමික, භාෂාමය, ජාති කුල භේද ඇති කරවන ප්‍රකාශවලින් තොරවිය යුතු ය.

(ඊ) මෙම කොන්දේසි කඩ කිරීම් විධාන උල්ලංඝණය කිරීමක් වන අතර, එම කොන්දේසි කඩවන ඕනෑම අවස්ථාවක එම පක්ෂයට, කණ්ඩායමට හෝ අපේක්ෂකයාට කරන දැනුම් දීමකින් පසු මෙම අවසරය නතර කළ හැක්කේ ය.

**03. තරඟ කරන පක්ෂ හා කණ්ඩායම් සඳහා නිවේදිත කාර්යාලය පිහිටුවීම.**

(අ) ඡන්ද විමසීමේදී ස්වකීය පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායම් ප්‍රවර්ධන කාර්යයන් ඉටුකිරීම පිණිස, තරඟ කරන පක්ෂ වලට හා ස්වාධීන කණ්ඩායම් වලට ඒ ඒ පළාත් පාලන ආයතනය වෙනුවෙන් හා යම් පළාත් පාලන ආයතනයක් සම්පූර්ණ ඡන්ද ප්‍රදේශ කිහිපයකින් සමන්විත වනවිට ඒ ඒ ඡන්ද ප්‍රදේශය වෙනුවෙන් එක් නිවේදිත මාධ්‍ය කාර්යාලයක් සහ එක් එක් කොට්ඨාසයක් සඳහා නිවේදිත ශාඛා කාර්යාලයක් නාමයෝජනා භාර දීමේ අවසන් දිනයේ සිට ඡන්ද විමසීමේ දිනයට පැය 48 කට පෙර අවසන් වන කාලසීමාව දක්වා, මැතිවරණ කොමිෂන් සභාව විසින් අවස්ථාවෝචිතව නියම කරනු ලබන උපදෙස් වලට හා සීමා කිරීම් වලට යටත්ව, පවත්වාගෙන යෑමට කොන්දේසි සහිත අනුමැතියක් ලබාදෙනු ලැබේ. එම උපදෙස්, සීමා කිරීම්, කොන්දේසි උල්ලංඝණය කරනු ලබන හෝ ඡන්ද විමසීම් නීතියට අනනුකූල ක්‍රියා හෝ මහජනතාව පීඩාවට පත්වන ක්‍රියා සිදුකරන කාර්යාල නීති විරෝධී කාර්යාල ලෙස සලකා ඡන්ද විමසීම් ආඥා පනත යටතේ සඳහන් විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන බවටද නිවේදනය කරනු ලැබේ.

(ආ) කොට්ඨාස සඳහා තරඟ කරන හෝ අතිරේක ලැයිස්තුවේ නම් සඳහන් අපේක්ෂකයන්ගේ පදිංචි නිවස කාර්යාලයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ද මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරන උපදෙස් හා සීමා කිරීම් වලට යටත්ව කොන්දේසි සහිත අනුමතියක් ලබා දෙනු ලැබේ. පදිංචි නිවසේ වුවද පවත්වාගෙන යන කාර්යාල ඡන්ද විමසීම් නීතියට හා මැතිවරණ කොමිෂන් සභාවේ කොන්දේසි වලට අනුකූලව මහජනතාවට පීඩාවක් නොවන සේ පවත්වා ගෙන යා යුතු බවද නිවේදනය කරනු ලැබේ.

| මහින්ද දේශප්‍රිය | එන්. ජේ. අබේසේකර | එස්. රත්නජීවන් එච්. හූල් |
|---|---|---|
| සභාපති | සාමාජික | සාමාජික |
| මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |

2018 ජනවාරි මස 05 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

01 - 808

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.